EMPLOYEES' TRUST FUND BOARD
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை

# 05 වසර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**<u>අයදුම්පත පිරවීමට ප්‍රථම උපදෙස් කියවන්න</u>.**

1. අයදුම්පත්‍රයේ **I කොටස** මාර්ග ගත ක්‍රමවේදය (online) ඔස්සේ ඉදිරිපත් කළ යුතු අතර, පහත සඳහන් ලියකියවිලි ද උඩුගත (upload) කළ යුතුය.

2. අයදුම්පත්‍රයේ **II කොටස** භාගත කර (Download) සේවායෝජක විසින් සාමාජිකයාගේ දායක මුදල් විස්තර සම්පූර්ණ කිරීමෙන් පසු මෙම උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති ඉදිරිපත් කළ යුතු ලියකියවිලි සමග සේවායෝජක සම්පූර්ණ කළ අකෘති පත්‍රය පරිලෝකනය (Scan) කර PDF ගොනුවක් සකසා ගත යුතුයි. එම ගොනුව ETF සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකයට Rename (නැවත නම්කර) කර උඩුගත (upload) කළ යුතුයි.

**<u>ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලියකියවිලි</u>**

3. ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් සහතික කර ඉදිරිපත් කළ යුතුයි. (විදුහල්පති විසින්ම සහතික කළ යුතු නොවන අතර, සාමදාන විනිශ්චයකාරවරයෙකු, ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු සහතික කිරීම ප්‍රමාණවත්ය. )

4. දරුවාගේ ප්‍රතිඵල ලේඛණයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුයි. (සහතික කිරීමට අවශ්‍ය නොවන අතර අන්තර් ජාලයෙන් ලබා ගන්නා ලද පිටපතක්ම විය යුතුයි.)

5. සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සේවායෝජක විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුයි.

6. පහත සඳහන් අඩුපාඩු පවතී නම් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලියකියවිලි උඩුගත (upload) කළ යුතුයි.

    - ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ප්‍රතිඵල ලේඛණයේ සඳහන් නම හා උප්පැන්න සහතිකයේ සඳහන් නම අතර වෙනසක් ඇත්නම් එම නම් දෙකෙන්ම හැඳින්වෙන්නේ මෙම ශිෂ්‍යයා / ශිෂ්‍යයාව බවට විදුහල්පති විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

    - ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ උප්පැන්න සහතිකයේ සඳහන් වන මවගේ / පියාගේ හෝ භාරකරුගේ නම, හා හැඳුනුම්පතෙහි නම අතර වෙනසක් පවතී නම් එම නම් සියල්ලෙන්ම හැඳින්වෙන්නේ එක් අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

- සේවායෝජක විසින් අයදුම්පතෙහි සදහන් කරන ලද නම, ආකෘති ii වාර්තාවල සදහන් නම හා හැදුනුම්පතෙහි නම අතර වෙනසක් පවතී නම් එම නම් සියල්ලෙන්ම හැදින්වෙන්නේ එක් අයෙකු බවට සේවා යෝජක විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ (මව/පියා විසින් නොවන අවස්ථාවක) භාරකරු නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්න.

7. දෙමාපියන් දෙදෙනාම සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වය දරන්නේ නම් එක් අයෙකු විසින් පමණක් ඉල්ලුම් කළ යුතුය.

8. එක් ශිෂ්‍යත්වලාභියෙක් වෙනුවෙන් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. මොනම හේතුවක් නිසාවත් අයදුම්පත් දෙකක් ඉදිරිපත් නොකරන්න.

9. ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින අවස්ථාව වන විට (2025 අගෝස්තු) සාමාජිකයා වෙනුවෙන් විභාගයට පෙනී සිටි මාසයට පෙර ආසන්න මාස 12 දායක මුදල් ගෙවා තිබිය යුතුයි. එම බැර කරන ලද දායක මුදල් වෙනුවෙන් අර්ධ වාර්ෂික වාර්තා ද / විද්‍යුත් ගෙවීම් (e – payment) වලට අදාල සේවක වාර්තාද මෙම අරමුදල වෙත එවා තිබිය යුතුය.

10. ස්වයංරැකියා සාමාජිකයින් සදහා විභාගයට පෙනී සිටි මාසයට පෙර ආසන්න මාස 36ක දායක මුදල් ශිෂ්‍යයා / ශිෂ්‍යාව විභාගයට පෙනී සිටින අවස්ථාව වන විට අඛණ්ඩව ගෙවා තිබිය යුතුයි.

11. **2025.11.30** දිනට පෙර www.etfb.lk වෙබ් අඩවියට පිවිස 05 වසර ශිෂ්‍යත්ව යටතේ අයදුම්පත සම්පූර්ණ කර උඩුගත කරන්න.

12. ඉහත සදහන් කොන්දේසි සම්පූර්ණ නොවූ හා අසම්පූර්ණ, අපැහැදිලි. වැරදි, තොරතුරු සපයන ඉල්ලුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. වසරකට තිළිණ ප්‍රදානය කරනු ලබන්නේ දිස්ත්‍රික්ක වලින් වැඩිම ලකුණු ලබා ගන්නා ශිෂ්‍ය / ශිෂ්‍යාවන් 9000 කට පමණි. ඉල්ලුම්පත් තෝරා ගැනීම පිළිබද අවසාන තීරණය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

වැඩි විස්තර සදහා

| | | |
|---|---|---|
| දුරකතන | :- | 011-7747200, 011-7747281, 0117747282 |
| වට්ස්ඇප් | :- | 071-6375045 |
| විද්‍යුත් ලිපිනය | :- | ofrschl@etfb.lk |